# ආගමන සමයේ නුවාතය
# දෙසැම්බර් 23

**පළමුවන කියවීම** — මලාකි 3: 1-4, 4: 5-6

මලාකි දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

*මට පෙරටුව මාගේ මාර්ගය පිළියෙල කරන්නා වූ මාගේ දූතයා මම එවන්නෙමි.*

සියලු බලැති සමිඳාණන් වහන්සේ මෙසේ පිළිතුරු දෙන සේක. "මම පෙරටුව ගොස් මාගේ මාර්ගය පිළියෙල කරන්නාවූ මාගේ දූතයා මම එවන්නෙමි. එවිට තුඹලා සොයමින් සිටින සමිඳාණන් වහන්සේ හදිසියෙන් තමන් දේව මාලිගාවට වඩින සේක. තුඹලා පුල පුලා බලා සිටින දූතයා පැමිණ මාගේ ගිවිසුම ප්‍රකාශ කරනු ඇත.

එහෙත් උන් වහන්සේගේ පැමිණීමේ දවස උහුලන්න පුළුවන් කවරෙකුට ද? උන් වහන්සේ ප්‍රකාශ වන විට ගැලවී සිටින්න පුළුවන් කවරෙකුට ද? උන් වහන්සේ රන් කරුවෙකුගේ ගින්න මෙන් ද අපුල්ලන්නෙකුගේ සබන් මෙන් ද වන සේක. එවිට ඔව්හු සමිඳාණන් වහන්සේ වෙත නියම පූජාවක් ගෙනෙන්නෝ ය. ජුදාවේ සහ ජෙරුසලමේ සෙනග සමිඳාණන් වහන්සේ වෙත ගෙනෙන පූජා පෙර කාලයේ දී මෙන් උන් වහන්සේට ප්‍රිය මනාප වන්නේ ය.

සමිඳාණන් වහන්සේගේ මහා භයානක දවස පැමිණෙන්න පෙර මම දිවැසිවර එලියා තුඹ වෙත එවන්නෙමි. මා පැමිණ තුඹලාගේ දේශය විනාශ නොකරන පිණිස, පියවරුන්ගේ සිත් දරුවන් වෙතට ද, දරුවන්ගේ සිත් පියවරුන් වෙතට ද හරවනු ලබනවා ඇත."

*දේව වචනය මෙසේ ය.*

| පිළිතුරු ගීය | ගීතාවලිය 25: 4–5, 8–9, 10, 14 |
|---|---|

පිළිතුර: ඔබේ විමුක්තිය ළංවේගෙන එන බැවින් හිස ඔසවන්න.

ගීය: සමිඳුනි, ඔබේ ක්‍රියා මාර්ගය මට හෙළි කළ මැනව.
ඔබේ මාවත් මට පැහැදිලි කළ මැනව.
ඔබේ සත්‍යය අනුව මා ගෙන ගිය මැනව. මට එය ඉගැන්නුව මැනව.
මන්ද, ඔබ මාගේ විමුක්තිදායක දෙවිඳාණෝ ය.
දවස පුරා ඔබ එන මග බලා සිටිමි.

සමිඳාණෝ යහපත් ය. අවංක ය.
එතුමාණෝ පව්වුන් හට යා යුතු මාර්ගය උගන්වන සේක.
එතුමාණෝ නිහතමානී අය යුක්තියෙහි හසුරුවන සේක.
එතුමාණෝ යටහත් පහත් අයට තම මාර්ගය උගන්වන සේක.

හිමි තුමන්ගේ ගිවිසුම හා ශික්ෂා පද පිළිපදින අයට
එතුමන්ගේ මාවත් කරුණාවේ හා සත්‍යයේ මාවත් වනු ඇත.
හිමි තුමන්ගේ රහස් සැලැස්ම
එතුමාණන් කෙරේ ගරු බිය පාන අයට පෙන්වා ඇත.
එතුමාණන් ස්වකීය ගිවිසුම ඔවුන්ට දන්වා ඇත.

<u>සාධුකාරය</u>

ආලේලූයා! ආලේලූයා!
අප අතර වැඩවසන අපගේ රජාණන් ද, විනිසකරුවාණන් ද වන
එම්මානුවෙල් අපගේ දෙවි සමිඳාණෙනි,
වැඩමකර අප ගළවා ගත මැනව.
ආලේලූයා!

සුවිශේසක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය මෙසේ ය.

*ස්නාවක ජුවාම් තුමාගේ උපත*

නියම කාලය පැමිණි විට එලිසබෙත් තොමෝ පුත්‍රයෙකු ලැබුවා ය. ඇගේ අසල්වැසියෝ ද නෑයෝ ද ස්වාමින් වහන්සේ ඇ. මහා දයානුකම්පාවක් දැක් වූ බැව් අසා ඇය සමග ප්‍රිති වූ හ. තව ද අට වන දා චර්මඡේදන පිළිවෙත පිණිස ඔව්හු දරුවා ගෙනැවිත් සිය පියාගේ නාමය අනුව ඔහුට සෙකරියස් යයි නම් තබන්නට සැරසුණ හ. එහෙත් ඔහුගේ මව කතා කරමින්, “එසේ නොවේ. ඔහුට ජුවාම් යන නාමය තැබිය යුතු යැ” යි කීවාය. “ඔබේ නෑයන් අතර ඒ නාමය ඇත්තෙක් නැතැ” යි ඔව්හු ඇට කීහ. “ඔහුගේ පියා ඔහුට කුමන නමක් තබන්න කැමති දැ” යි දැන ගන්නා පිණිස ඔව්හු ඔහුට සංඥා කළහ. සෙකරියස් ගල්ලෑල්ලක ඉල්ලා ගෙන, “ඔහුගේ නම ජුවාම් ය” යි ලිව් ය. සියල්ලෝ ම මවිත වූ හ. එකෙණෙහි ම ඔහුගේ කතා ශක්තිය ලැබිණි. ඔහු දෙවියන් වහන්සේ පසසමින් කථා කළේ ය. අසල්වැසි සියල්ලන් කෙරෙහි බිය පැමිණියේ ය. මෙපවත් සියල්ල ජුදයේ කඳුරට පුරා පතළ විය. ඒ ඇසූ හැම දෙන ම ඒ සියල්ල සිය සිත්හි තබා ගෙන, “ඉතින් මේ දරුවා කෙබඳු කෙනෙක් වන්නේ දැ” යි ඇසූ හ. මක්නිසා ද ස්වාමින් වහන්සේගේ හස්තය ඔහු කෙරෙහි විය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*